# සමූපකාර සේවක කොමිෂන් සභාව (දකුණු පළාත)
## கூட்டுறவு ஊழியர் ஆணைக்குழு (தென் மாகாணம்)
## Co-operative Employees Commission (Southern Province)

සැලසුම් ලේකම් කාර්යාලයීය ගොඩනැගිල්ල (1 වන මහල), එස්. එච්. දහනායක මාවත, ගාල්ල.
திட்டமிடல் செயலாளர் அலுவலக் கட்டிடம் (1ம் மாடி), எஸ்.எச், தஹநாயக மாவத்தை, காலி.
**Planning Secretariat Building (1 st Floor), S. H. Dahanayaka Mawatha, Galle.**




| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. } SP/CEC/1/0/5 | ඔබේ අංකය / உனது இல / Your No. } | දිනය / திகதி / Date } 2023.06.13 |

චක්‍රලේඛ අංක : **04/2023**

දකුණු පළාතේ සියලුම සමූපකාර සමිතිවල සභාපතිවරුන් වෙත,

**<u>බෝවන රෝග සඳහා නිවාඩු ලබා දීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් **2023.01.31** දින සිට බලපැවැත්වෙන පරිදි පහත සඳහන් විධිවිධාන අනුව කටයුතු කරන ලෙස කොමිෂන් සභා නියමය පරිදි දන්වා සිටිමි.

2.1 : බෝවන රෝග සඳහා සම්පූර්ණ වැටුප් සහිත විශේෂ නිවාඩු ලබා ගැනීමට සමූපකාර සමිතියක ස්ථිර සේවකයෙකුට හැකි ය.

2.2 : මෙම විශේෂිත නිවාඩුව ලබා ගත හැකි වන්නේ සාමාන්‍ය නිවාඩු රෙගුලාසි යටතේ හිමි වැටුප් සහිත නිවාඩු හා ඉකුත් නිවාඩු අවසන් වීමෙන් පසුව ය.

2.3 : සේවකයාට වැළඳී ඇති බෝවන රෝගයක් පිළිබඳව ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා දැනුවත් කළ යුතු අතර, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීගේ සහතිකය මත එම සේවකයාට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයා විසින් අනුමත කරන කාලයකට වැටුප් සහිත නිවාඩු ලබා දිය යුතුවේ.එහෙත් නිවාඩු කාලය මාස 03ක් ඉක්මවූ අවස්ථාවලදී එම තෙමසට පසු මාස 03ක උපරිමයකට යටත්ව අඩවැටුප් සහිත නිවාඩු ලබා දිය හැකි ය.

2.4 : විශේෂ නිවාඩු යටතේ වැටුප් සහිත හා අඩ වැටුප් සහිත නිවාඩු අවසන් වූ පසුවද යම් රෝගී තත්ත්වයක් නිසා අදාල සේවකයාට තවදුරටත් නිවාඩු අවශ්‍ය වුවහොත් ඒ සඳහා රජයේ රෝහලකින් නිකුත් කරන ලද වෛද්‍ය වාර්තාවක් මත මාස 06ක උපරිමයකට යටත්ව වැටුප් රහිත නිවාඩු ඉල්ලා සිටීමට පුළුවන. එවැනි අවස්ථාවක් එළඹුනහොත් එම අවස්ථාවේදී අදාල සේවකයාගේත්, අනිකුත් සේවකයින්ගේත්,සමිතියේත්, යහපත සලකා දිගින් දිගට ම වැටුප් රහිත නිවාඩු මත සේවකයා සේවයේ තබා ගැනීම යුක්ති සහගතද නැතහොත් සෞඛ්‍ය හේතූන් මත විශ්‍රාම ගැන්විය යුතුද, යන්න පිළිබඳව සලකා බැලීම සඳහා සමිතිය විසින් රෝහල් වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක නිර්දේශ ඉල්ලා සිටිය යුතුය. එවිට වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ අනුව රෝගී සේවකයා සම්බන්ධයෙන් සුදුසු තීරණයක් ගැනීමට සමිතියේ කාරක සභාවට පුළුවන.

2.5 : අඩ වැටුප් කාලපරිච්ඡේදයට වැටෙන සති අන්ත හා අනිකුත් සියළුම නිවාඩු දින, වැටුප් සහිත නිවාඩු සේ සැලකිය යුතු ය.

2.6 : සේවකයෙකු අඩ වැටුප් සහිත නිවාඩු ලබා ගෙන ඇත්නම් ඔහුගේ සේවා කාලය ගණනය කරන අවස්ථාවේදී ඔහු ලබා ගත් අඩ වැටුප් සහිත නිවාඩු කාලපරිච්ඡේදයෙන් අඩක් පමණක් සේවා කාලයට ඇතුළත් කළ යුතු ය.වැටුප් රහිත නිවාඩු සේවා කාලයට ගණනය නොකළ යුතු ය.

කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ජයන්ත ජී.ලියනගේ.
ලේකම්,
සමූපකාර සේවක කොමිෂන් සභාව,
දකුණු පළාත.

පිටපත :- 01. ලේකම්,කෘෂිකර්ම ගොවිජන සං....සමූපකාර අමා.(ද.ප.). - දැ.ස.
02. සමූපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් (ද.ප) -කරු.සමූ.සං.ප්‍රා.නි. හරහා අදාල සමිති දැනුවත් කිරීම සඳහා.
03. දකුණු පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛ ගොනුවට - දැ.ස.